**සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**මහනුවර**
********

<u>මාධ්‍ය නිවේදනය</u>

විශ්ව හින්දී දින සැමරුම මහනුවර (ශ්‍රී ලංකාව)

සහකාර ඉන්දියානු මහ කොමසාරිස්, මහනුවර,විශ්ව හින්දි දිනය 2022 පෙබරවාරි 16 වැනි දින මහනුවර ග්‍රෑන්ඩ් කැන්ඩියන් හෝටලයේදී සමරන ලදී. සහකාර ඉන්දීය මහ කොමසාරිස් වෛද්‍ය ආතිරා එස්. මහත්මියගේ පිළිගැනීමේ කතාවෙන් සැමරුම් උත්සවය ආරම්භ වූ අතර ප්‍රධාන ආරාධිත අමුත්තා වූ සබරගමුව විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා භාෂා පීඨයේ පීඨාධිපති ආචාර්ය සම්පත් ප්‍රනාන්දු මහතා සහ ගෞරවනීය ආරාධිත අමුත්තන් වූ සබරගමුව විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ අංශාධිපති ආචාර්ය මහේෂ් හපුගොඩ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ලලිත කලා අධ්‍යයනාංශයේ අංශාධිපති ආචාර්ය සුදේශ් මන්තිලක, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හින්දී භාෂාව පිළිබඳ කථිකාචාර්ය ආචාර්ය වජිරා ගුණසේන මහත්මිය සහ සබරගමුව විශ්වවිද්‍යාලයේ හින්දී භාෂාව පිළිබඳ කථිකාචාර්ය බ්‍රසිල් නාගොඩ විතාන මහතා ඇතුළු පිරිස සභාව ආමන්ත්‍රණය කරන ලදී.

2. මෙම උත්සවය ශ්‍රී ලංකාව තුළදී හින්දී භාෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය අදහස් හුවමාරු කර ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ හින්දී භාෂාව ප්‍රචලිත කිරීමට සහ ප්‍රවර්ධනයට දායක වීම වෙනුවෙන් හින්දි ගුරුවරුන් 14 දෙනෙකුට හින්දි 'ප්‍රචාර් ප්‍රසාර් සම්මාන්' පිරිනමන ලදී. මෙම උත්සවයට පෙර විවිධ අධ්‍යයන මට්ටම්වල සිසුන් සඳහා හින්දි තරග (කථනය, කවි කියවීම, හින්දී අසා ලිවීම ආදිය) සංවිධානය කරන ලදී. මෙම තරග සඳහා විවිධ විශ්වවිද්‍යාල, විද්‍යාල සහ පාසල් නියෝජනය කරමින් තරගකරුවන් 100 දෙනෙකු සහභාගී විය. මහනුවර සහකාර ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයෙහි නිලධාරීන් සඳහා හින්දී තරග කිහිපයක් ද සංවිධානය කරන ලදී. විවිධ හින්දි තරගවල ජයග්‍රාහකයින් සඳහා ඇගයීම් සහතික මෙන්ම මුදල් ත්‍යාග ප්‍රදානය කෙරිණි.

3. Covid මාර්ගෝපදේශ අනුගමනය කරමින් හින්දී වෘත්තිකයන්, හින්දී භාෂාවට ප්‍රිය කරන්නන්, ගුරුවරුන් සහ සිසුන් 100 ක් පමණ මෙම අවස්ථාවට සහභාගී වූහ. සහභාගි වූ සියලුම දෙනාට ස්තුතිය ප්‍රකාශ කිරීමකින් උත්සවය අවසන් විය.

*********

මහනුවර
2022 පෙබරවාරි 16